මාතලේ මහා නගර සභාව
මාතලේ දිස්ත්‍රික්කය

1. මූල්‍ය ප්‍රකාශන
-----------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
---------------------------------

2017 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2018 මාර්තු 29 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2018 අගෝස්තු 27 දින සභාපති වරයාට යවා ඇත.

1.2 තත්ත්වාගණනය කළ මතය
------------------------------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශන වලින් 2017 දෙසැම්බර් 31 දිනට මාතලේ මහා නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම
-------------------------------------

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු
-------------------------

පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) 2014 හා 2015 වර්ෂවල සිට පැවත එන ක්‍රියාත්මක නොවූ හා ලිපිගොනු හඳුනාගත නොහැකි කර්මාන්ත 10 කට අදාළ කර්මාන්ත ණයහිමි ශේෂය වූ රු.2,301,118 කින් ණයහිමියෝ හා ප්‍රාග්ධන වැය වැඩියෙන් දැක්වුණි.

(ආ) පරිගණක 7 ක පිරිවැය, පරිගණක ජාලය ස්ථාපිත කිරීමට අදාළ වියදම හා අභ්‍යන්තර දුරකථන පද්ධතිය සඳහා වියදම වශයෙන් එකතු වටිනාකම වූ රු.1,319,530 ක් ප්‍රාග්ධනීත කර නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය තුළ සභා අරමුදල් යටතේ ඉටුකළ රු. 7,051,264 ක් වටිනා කර්මාන්ත වියදම පුනරාවර්තන වියදම් යටතේ ගිණුම්ගතකර තිබුණි.

(ඈ) සේවක ණය ලේඛනය අනුව සමාලෝචිත වර්ෂය අවසානයට මධ්‍යම පළාත්, පළාත් පාලන දෙපාර්තමේන්තුවට යැවියයුතු රු.557,818 ක ණය ශේෂය මූල්‍ය ප්‍රකාශනවල රු.1,366,962 ක් ලෙස දැක්වීමෙන් විවිධ ණයහිමියෝ රු.809,144 ක් වැඩියෙන් දැක්වුණි.

(ඉ) සමාලෝචිත වර්ෂයට අදාළව ලැබියයුතු තානායම් කුලී ආදායම රු.593,141 ක් වුවද, රු.741,426 ක් ලෙස ගිණුම්ගත කිරීමෙන් රු.148,285 ක් වැඩියෙන් දක්වා තිබුණි.

(ඊ) වර්ෂය අවසානයට විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවට ගෙවියයුතු රු.15,234,435 ක දායක මුදල මූල්‍ය ප්‍රකාශනවල රු.14,618,675 ක් ලෙස දැක්වීමෙන් රු.615,760 කින් ණයහිමියෝ අඩුවෙන් දැක්වුණි.

(උ) භෞතික පැවත්මක් නොමැති වාහන 10 ක හා කසළ කරත්තවල වටිනාකම් මෝටර් රථ හා කරත්ත ගිණුම තුළ දැක්වීමෙන් එම ගිණුමේ ශේෂය රු.2,875,508 කින් වැඩියෙන් දැක්වුණි.

(ඌ) 2017 වර්ෂයේ ලංකා බැංකුවේ ආයෝජනය කර තිබූ ස්ථාවර තැන්පත් ශේෂයට අදාළ 4 වන කාර්තුවේ ආයෝජන පොළී රු.209,232 ක් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දැක්වුණි.

(එ) සමාලෝචිත වර්ෂයට අදාළ රු.6,986,965 ක කර්මාන්ත ආධාර මූල්‍ය ප්‍රකාශනවල රු.5,332,520 ක් ලෙස ගිණුම් තැබීමෙන් කර්මාන්ත ආධාර 1,654,445 ක් අඩුවෙන් දැක්වුණි.

1.3.2 නොසැසඳුණු ගිණුම්

----------------------

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන එකතුව රු.92,595,357 ක් වූ ගිණුම් විෂයන් 6 කට අදාළ ශේෂයන් සහ ඒවාට අදාළ උපයෝගී ලේඛන හා වාර්තාවල දැක්වෙන ශේෂයන් අතර වෙනස්කම් පැවති අතර, නිරීක්ෂණය වූ අසමානතාවල එකතුව රු.27,346,416 ක් විය.

1.3.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

-------------------------------------

(අ) ලැබිය යුතු ගිණුම්

--------------------

සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට ලැබිය යුතු ගිණුම් ශේෂ 13 ක එකතුව රු.80,698,337 ක් වූ අතර, ඉන් ගිණුම් ශේෂ 8 ක් සඳහා ඉදිරිපත් කරන ලද කාල විශ්ලේෂණයට අනුව වර්ෂ 3 කට වැඩි කාලයක් තිස්සේ නිරවුල් නොවී පවතින රු.1,676,367 ක් වූ ශේෂයක්ද ඊට ඇතුළත්ව තිබුණි.

(ආ) ගෙවිය යුතු ගිණුම්

--------------------

සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට ගෙවිය යුතු ගිණුම් ශේෂ 3 ක වටිනාකම රු.113,534,099 ක් වූ අතර, ඉදිරිපත් කරන ලද කාල විශ්ලේෂණයට අනුව වර්ෂ 3කට වැඩි කාලයක් තිස්සේ නිරවුල් නොවී පවතින රු.82,655,707 ක ශේෂයක්ද ඊට ඇතුළත්ව තිබුණි.

1.3.4 විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම

------------------------------------------------------

තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම

---------------------------------------------

අවශ්‍ය තොරතුරු ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.9,681,993 ක් වූ ගිණුම් විෂයයන් 5 ක් විගණනයේදී සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට නොහැකි විය.

1.3.5 අනුකූල නොවීම්

------------------

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

--------------------------------------------------------------------------

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම |
| --- | --- |
| (අ) 1989 ජනවාරි 20 දිනැති අංක 541/17 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද සම්මත අතුරු ව්‍යවස්ථාවේ III කොටසේ 15 වගන්තිය | සභාවට අයත් ඉඩම් ගොඩනැගිලි හා වෙනත් ස්ථිර වත්කම් සම්බන්ධයෙන් යාවත්කාලීනව පැවැත්වූ වාර්තා නොතිබුණි. |
| (ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි | |
| (i) මුදල් රෙගුලාසි 104(3) සහ (4) | - 2016 නොවැම්බර් 4 දින එක්ස්කැවේටර් යන්ත්‍රය අනතුරට පත්වීම පිළිබඳව ප්‍රාරම්භක වාර්තාව අනතුර සිදුවී මාස 8 කුත් දින 13 ක් ගතවීමෙන් පසු ඉදිරිපත්කර තිබුණි. යන්ත්‍රය රු.222,525 කට අළුත්වැඩියා කර රක්ෂණයෙන් ප්‍රතිපූර්ණය නොවූ රු.110,525ක් සභා අරමුදලෙන් දරා තිබූ නමුත් 2018 ජුනි 30 දින වන විටත් අලාභ හානියට අදාළ පරිපූර්ණ වාර්තාවක් ඉදිරිපත්කර නොතිබුණි.<br><br>- 2017 මැයි 29 දින අනතුරකට පත් මෝටර් රථය අදාළ නියෝජිත ආයතනය වෙත යොමු කර රු.2,135,620 ක අලුත්වැඩියාවක් සිදුකර තිබුණි. රක්ෂණයෙන් ප්‍රතිපූර්ණය නොවූ රු.283,237 ක් සභා අරමුදලින් දරා තිබූ නමුත් අවශ්‍ය පරීක්ෂණ පවත්වා පරිපූර්ණ වාර්තාවක් 2018 ජුනි 30 වන විටත් ඉදිරිපත් කර නොතිබුණි. |
| (ii) මුදල් රෙගුලාසි 571 | තැන්පත් ගිණුමේ රඳවා ඇති නිරවුල් කර ආදායමට ගතයුතු රු.675,000 ක ශේෂ 4 ක් ආදායමට ගෙන නොතිබුණි. |
| (iii) මුදල් රෙගුලාසි 1645 (ආ) සහ 1646 | මහා නගර සභාව සතු ධාවන තත්ත්වයේ ඇති වාහන 8 ක ධාවන සටහන් විගණනයට ඉදිරිපත්කර නොතිබුණි. |
| (ඇ) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ | |
| (i)2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන චක්‍රලේඛයේ 3.1 වගන්තිය | වාහන 25 ක ඉන්ධන දහනය පරීක්ෂාකර නොතිබුණි. |

(ii) 2017 දෙසැම්බර් 07 දිනැති අංක 33/2017 දරන චක්‍රලේඛ

ක්ෂේත්‍ර රාජකාරියේ නියුතු කර්මාන්ත අංශයට අනුයුක්ත සංවර්ධන නිලධාරීන් තිදෙනෙකු හා ලේකම් අංශයට අනුයුක්ත සංවර්ධන නිලධාරීන් දෙදෙනෙක් ඉදිරි වැඩසටහන්, සංශෝධිත වැඩසටහන් සහ කළවැඩ වාර්තා ඉදිරිපත්කර නොතිබුණු බැවින් ඔවුන් ඉටුකළ ක්ෂේත්‍ර රාජකාරි පිළිබඳව නිවැරදිතාවයද සනාථ කරගත නොහැකි විය.

(ඇ) වෙනත් චක්‍රලේඛ මධ්‍යම පළාත් ප්‍රධාන ලේකම්ගේ 1991 මාර්තු 26 දිනැති අංක 3/91 දරන චක්‍රලේඛය

නගර සභාවේ කර්මාන්ත අංශයට අයත් විධායක නිලධාරීන් හා ඉදිරිවැඩසටහන් ඉදිරිපත් කළයුතු ක්ෂේත්‍ර නිලධාරීන් විසින් තම ඉදිරි වැඩසටහන් සකස්කර පෙර මාසයේ 25 දිනට පෙර ඉදිරිපත් කර අනුමැතිය ලබාගෙන නොතිබුණි.

1.3.6 ප්‍රමාණවත් අධිකාර බලයකින් තහවුරු නොවූ ගනුදෙනු

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) කර්මාන්ත අංශයට අනුයුක්ත ක්ෂේත්‍ර රාජකාරීන්හි යෙදුනු වැඩ පරිපාලකවරුන් සඳහා රු.210,844 ක අතිකාල දීමනා ලබාදීම සිදුකර තිබුණද, එකී දීමනා සඳහා අනුමැතිය ලබාදුන් සභා තීරණයක් හෝ වෙනත් විශේෂ අනුමැතියක් නොතිබුණි.

(ආ) නාගරික සංවර්ධන අධිකාරියේ අංක 1597/8 දරන 2009 අප්‍රේල් 17 දිනැති අතිවිශේෂ ගැසට් පත්‍රයේ V වන උපලේඛනයේ පළමුවන නියෝගය අනුව අදාළ පෙරසැරි ගාස්තුද අයකරමින් තිබියදී එම ගාස්තුවට අමතරව කිසිදු විධිමත් නීතියකට අනුගත නොවී සහ ගාස්තුවට අදාළ සේවයක් සැපයීමෙන් තොරව 2010 ජනවාරි 27 දිනැති අංක 8:1:13 දරන සභා තීරණය පදනම් කරගනිමින් ගොඩනැගිලි අනුමත කිරීමේ කාර්ය සඳහා අදාළ ගොඩනැගිල්ලේ වර්ග අඩි ප්‍රමාණය මත සැළසුම් ශිල්පීය ගාස්තු නමින් ගාස්තුවක් අයකරමින් පැවතුණු අතර 2016 වර්ෂයේදී හා 2017 සැප්තැම්බර් 30 දින දක්වා පිළිවෙලින් රු.950,108 ක් හා රු.465,016 ක් අයකර තිබුණි.

2. මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු 63,175,930 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.47,092,890 ක් විය.

2.2 ආදායම් පරිපාලනය

2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කල ආදායම්, රැස්කල ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | ආදායම් ප්‍රභවය | 2017 ඇස්තමේන්තුගත ආදායම | 2017 බිල්කළ ආදායම | 2017 රැස්කළ ආදායම | 2017 දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | 2016 ඇස්තමේන්තුගත ආදායම | 2016 බිල් කළ ආදායම | 2016 රැස්කළ ආදායම | 2016 දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 36,150,000 | 36,221,114 | 24,756,470 | 23,836,699 | 36,150,100 | 36,202,989 | 24,165,081 | 23,718,426 |
| (ii) | කුලී | 18,671,000 | 19,110,584 | 16,528,021 | 4,167,134 | 25,522,000 | 17,386,895 | 14,399,804 | 3,088,592 |
| (iii) | බලපත්‍ර | 8,033,000 | 10,647,215 | 10,089,290 | 14,000 | 6,233,000 | 10,672,158 | 10,594,038 | 77,000 |
| (iv) | වෙනත් ආදායම් | 45,483,600 | 60,732,943 | 15,311,825 | 52,993,783 | 47,045,900 | 62,283,361 | 24,621,451 | 43,321,278 |

### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) මහා නගර සභා ගිණුම් අංශයේ ගණනය කිරීම් අනුව 2009 වර්ෂයේ ටෙන්ඩර් කර ලබාදී තිබූ සුපිරි වෙළඳ සංකීර්ණයේ කඩකාමර බදුකරුවන් 14 දෙනෙකුගෙන් 2014 වර්ෂය අවසාන වන විට අයවියයුතු රු.4,170,527 ක එක්වන් මුදල අය නොවීම මත සමාලෝචිත වර්ෂය අවසාන වන විට 10% ප්‍රමාද ගාස්තු ඇතුළුව රු.18,860,263 ක් අයවියයුතුව තිබුණි.

(ආ) මහා නගර සභාව විසින් පවත්වාගෙන යන ලද ජල සැපයුම් පද්ධතිය 2001 වර්ෂයේදී ජාතික ජල සම්පත් මණ්ඩලයට පවරන අවස්ථාව වන විට අයවීමට තිබුණු රු.4,802,812 ක හිඟහිටි ජල ගාස්තු ශේෂය සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් අයකර ගැනීමට හෝ සුදුසු කටයුත්තක් කිරීමට පියවරගෙන නොතිබුණි.

### 2.2.3 වරිපනම්

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට හිඟහිටි වරිපනම් බදු ශේෂය රු.23,836,699 ක් විය.

(ආ) සභාව විසින් වරිපනම් ආදායම් ලේඛන නඩත්තු නොකිරීම මත ඉහත හිඟය පිළිබඳ කාල විශ්ලේෂණයක් ලබාගත නොහැකි වූ අතර, හඳුන්වා දී තිබූ පරිගණක වැඩසටහන අනුව ඉදිරි වර්ෂයට ගෙවීම් හඳුනා ගැනීමේ ක්‍රමවේදයක් නොවීය.

(ඇ) 2011 වර්ෂයේ තක්සේරු දෙපාර්තමේන්තුවෙන් වරිපනම් බදු තක්සේරු කිරීමේදී පුද්ගලයින් නිවසේ නොසිටීම මත හා අයිතිකරු හඳුනා නොගත් දේපල සඳහා "අයිතිකරු " ලෙස දක්වා වරිපනම් බිල් කිරීම හා එකී අයිතිකරුවන් හඳුනාගෙන ඉදිරි කටයුතු සිදු නොකිරීම හේතුවෙන් නියැදි පරීක්ෂාවට ලක්කළ කොට්ඨාශ 8ක අයිතිකරු ලෙස දක්වා තිබූ ඒකක 364 කින් 2017 ජූනි 30 දිනට හිඟ වරිපනම් ශේෂය රු.1,251,067 ක් විය.

(ඈ) කොට්ඨාශ අංක 11 හි සොයාගත නොහැකි ලෙස දක්වා තිබූ දේපල 8 කට අදාළව රු.54,956 ක හිඟ ශේෂයක් හා 2011 වර්ෂයේ සිට පැවත එන කොට්ඨාශ අංක 10 හා 11 හි

වසා ඇති දේපල 17 කට අදාළ රු.186,213 ක හිඟ ශේෂයන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඉ) කොට්ඨාශ අංක 9 හි සභාවේ අනුමැතියකින් තොරව ඉදිකර තිබූ අනවසර ගොඩනැගිලි 34 ක් සම්බන්ධයෙන් කිසිදු පියවරක් ගෙන නොතිබියදී වරිපනම් අංක ද ලබාදී එම ගොඩනැගිලි නීත්‍යානුකූල බවට පත්කර තිබුණි. 2017 මැයි 30 දිනට එම ගොඩනැගිලිවලින් අයකරගතයුතු හිඟ වරිපනම් බදු රු.70,049 ක් විය.

2.2.4 කුලී ආදායම්

--------------

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට හිඟහිටි කඩකුලී ශේෂය රු.4,167,133 ක් වූ අතර, දීර්ඝ කාලීනව හිඟහිටි ආදායම් සම්බන්ධයෙන් ගිවිසුම් ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ආ) හිඟ කාමර කුලී නොගෙවීම මත ගොංගාවෙල හා අඹගහමුල වෙළඳ සංකීර්ණවල කඩ කාමර මුද්‍රා තබා තිබූ අතර , කඩ කාමර 4 කින් අවුරුදු 1 ත් 3 ත් අතර, කාලයක සිට පැවත එන රු.204,745 ක් සහ කඩ කාමර 7 කින් අවුරුදු 3 ට වැඩි කාලයක සිට පැවත එන රු.207,892 ක හිඟ ශේෂයක් අයකරගෙන නොතිබුණි.

(ඇ) සුපිරි වෙළඳ සංකීර්ණයේ කඩ කාමර 3 ක දීර්ඝ කාලයක සිට පැවත එන රු.101,696 ක හිඟ ශේෂයක් හා ගොංගාවෙල පැරණි වෙළඳපල කඩ කාමර 3 ක් වෙනුවෙන් රු.261,373 ක ශේෂයක් අයකරගත නොහැකිව පැවතුණි.

(ඈ) කෙලින් වීදියේ පෞද්ගලික ආපන ශාලාවක් අසල පැවති ලොතරැයි කුටියෙහි හිමිකරුගෙන් වසර 4 ක සිට පැවත එන රු.6,120 ක හිඟ ශේෂයක් අයකරගෙන නොතිබියදී 2017 වර්ෂයේදීත් ලොතරැයි කුටි 2 ක් පවත්වාගෙන යාමට අවසර දී තිබුණි. එමෙන්ම සමාලෝචිත වර්ෂය අවසානයට ලොතරැයි කුටි 9 ක් සඳහා අයවියයුතු රු.69,410 ක ශේෂයක් පැවතුණි.

(ඉ) ටෙලිකොම් ආයතනය විසින් මාතලේ මහා නගර සභා බලප්‍රදේශය තුළ පවත්වාගෙන ගිය දුරකථන කුටි 17 ක් වෙනුවෙන් 2014 වර්ෂයට පෙර සිට අයවියයුතු රු.25,336 ක මුදලක් අයකරගෙන නොතිබුණි.

(ඊ) 2007 වර්ෂයේ සිට පුද්ගලයින් 04 දෙනෙකුගෙන් අයවියයුතු රු.307,281 ක වැසිකිළි බදු කුලී අයකරගෙන නොතිබුණි.

2.2.5 උසාවි දඩ හා මුද්දර ගාස්තු

-----------------------------

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් නිලධාරීන්ගෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබියයුතුව තිබූ උසාවි දඩ රු.322,800 ක් හා මුද්දර ගාස්තු රු.48,042,960 ක් විය.

2.2.6 අධිභාර

--------

මහා නගර සභා ආඥා පනත (252 වන අධිකාරය) යටතේ වගකිවයුතු අයවලුන්ට එරෙහිව මවිසින් පනවන ලද අධිභාර අනුව 2017දෙසැම්බර් 31 දිනට රු.96,851 ක මුදලක් අයවිය යුතුව තිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය
-------------------------

3.1 කාර්යසාධනය
------------------

මහා නගර සභා ආඥා පනතේ 4 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුඛ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

(අ) අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම
------------------------------------------------

සභා අරමුදල් සහ විවිධ ප්‍රතිපාදන යටතේ කර්තව්‍යයන් 3ක් ඉටු කිරීම සඳහා රු.5,038,749 ක් වැය කර තිබුණද අපේක්ෂිත නිමවුම් මට්ටම අත්පත්කරගෙන නොතිබුණු අවස්ථා පහත දැක්වේ.

| | කර්තව්‍ය | ඇස්තමේන්තු මුදල/ ප්‍රතිපාදිත මුදල | ඉටුකළ ප්‍රමාණයේ වටිනාකම | නිරීක්ෂණ |
|---|---|---|---|---|
| | --------- | ---------- | ----------- | ----------- |
| | | රු. | රු. | |
| (i) | මෝලන්දපිටිය පැවති පැරණි සායන මධ්‍යස්ථාන ගොඩනැගිල්ල කඩා ඉවත්කර එම ස්ථානයේම නව සායන මධ්‍යස්ථානයක් ඉදිකිරීම<br>- සභා අරමුදල් සහ මන්ත්‍රී ආධාර | 2,368,905 | 2,219,729 | සමාලෝචිත වර්ෂය අවසානය වන විටත්, භාවිතයට ගතහැකි අයුරින් ඉදිකිරීම් නිමකර නොතිබුණු බැවින් සායන මධ්‍යස්ථානය පැවත්වීමට නොහැකි වී තිබුණි.ප්‍රතිලාභී පවුල් 900 ක් පමණ ආවරණය කරනු ලබන මෙම සායනය පැවත්වීම සඳහා වෙනත් තාවකාලික ස්ථාන තෝරා ගැනීම හේතුවෙන් විවිධ දුෂ්කරතා ඇති වී තිබුණි. |
| (ii) | ඩෝල පාර ප්‍රජා ශාලාව ආශ්‍රිතව මාතෘ සායන මධ්‍යස්ථානය සහ ළමා සුරකුම් මධ්‍යස්ථානය සඳහා ගොඩනැගිල්ල ඉදිකිරීම්<br>- සභා අරමුදල් | 2,104,648 | 1,959,447 | (i) ඉදිකිරීම් ආරම්භ කර වසර 2 කට ආසන්න කාලයක් ගතවී ඇතත්, භාවිතයට ගැනීමට සුදුසු පරිදි වැඩ නිමකර නොතිබුණි.<br><br>(ii) සායනය වෙනත් ස්ථානයක පැවැත්වීමට සිදුවී තිබූ බැවින් ඖෂධ, ලිපිලේඛන හා ත්‍රිපෝෂ ගබඩා කර තැබීමට ප්‍රමාණවත් ඉඩ පහසුකම් ද නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| (iii) | මාතලේ මහා නගර සභාවේ මළ අපද්‍රව්‍ය පිරිපහදු කිරීමේ ව්‍යාපෘතිය අලුත්වැඩියා කිරීම.<br>- පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශ ප්‍රතිපාදන | 4,307,237 | 859,573 | (i) 2007 වර්ෂයේ ජර්මානු ප්‍රදාන යටතේ රු.1,500,000 ක් වැයකර ඉදිකර තිබුණු හිග්ගොල්ල පල්දෝරු පද්ධතිය අක්‍රිය තත්ත්වයේ පවතින බැවින් එය අලුත්වැඩියා කිරීමට 2015 ජූනි 23 දින තීරණය කර එදින සිට මාස 8 ක පමණ කාල ප්‍රමාදයකින් යුතුව උපදේශන සේවා ලබා ගැනීමට තීරණය කර තිබුණි.<br><br>(ii) උපදේශන සේවා ආයතන ඉදිරිපත් කළ මිල ගණන් තෝරා ගැනීම සඳහා තාක්ෂණ ඇගයීම් කමිටු වාර්තාවක් නොවූ අතර ආයතනය විසින් ඉදිරිපත් කළ පිරිවැය ඇස්තමේන්තු සලකා බැලූ බවට සාක්ෂියක්ද නොතිබුණි.<br><br>(iii) 2018 ජූලි 8 දින වන විටත්, මුළු පිරිවැය ඇස්තමේන්තුවෙන් සියයට 10 ක වැඩ ප්‍රමාණයක් පමණක් නිමකර තිබුණි. |

(ආ) අපේක්ෂිත ප්‍රතිලාභ ලබා නොගැනීම

---------------------------------------

ධාරිතා සංවර්ධන වැඩසටහන යටතේ සංවර්ධනය කරන ලද පරිගණක මෘදුකාංගයක් සඳහා පරිගණක ජාලය ස්ථාපිත කිරීමට රු.971,530 ක් වැයකර තිබූ නමුත් ස්ථාපිත කර ඇති ජාලයට ප්‍රමාණවත් පරිදි අන්තර්ජාල පහසුකම් ලබා නොගැනීම හේතුවෙන් අපේක්ෂිත අරමුණු ඉටු වී නොතිබුණි.

(ඇ) අත්හැර දැමූ කර්තව්‍යයන්

------------------------------

ඉකුත් වර්ෂයන් තුළදී පළාත් පාලන සහ පළාත් සභා අමාත්‍යාංශ ප්‍රතිපාදන යටතේ සභාවට අයත් වාහන අංගනය නවීකරණය කිරීමේ කර්මාන්තය ආරම්භ කර ඒ සඳහා රු.4,058,881 ක් වැයකර තිබුණි. එහෙත් මුළු පිරිවැය ඇස්තමේන්තුවෙන් සියයට 29ක පමණ වැඩ කොටසක් නිමකර කර්මාන්තය නවතා තිබූ බැවින් අඩක් නිමකළ ගොඩනැගිල්ල නිෂ්කාර්යව පැවතුණි.

(ඈ) කර්තව්‍යයන් ඉටු කිරීමේ ප්‍රමාදයන්

-------------------------------------

අයවැය ලේඛනය මඟින් රු.2,500,000 ක ප්‍රතිපාදන සලසා තිබූ සුපිරි වෙළඳ සංකීර්ණයේ අලුත්වැඩියා කටයුතු සහ පිළියෙල කර තිබූ ක්‍රියාකාරී සැලැස්ම අනුව වර්ෂය තුළ ක්‍රියාත්මක කිරීමට සැළසුම්කර තිබූ ඇස්තමේන්තුගත වියදම රු.125,500,000 ක් වූ ව්‍යාපෘති 5 ක් ක්‍රියාත්මකකර නොතිබුණි.

(ඉ) ඝන අපද්‍රව්‍ය කළමනාකරණය

-----------------------------------

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(i) 2015 වර්ෂයේදි පිළිසරු ව්‍යාපෘති ආධාර යටතේ රු.9,343,457 ක් වැයකර ඉදිකර ඇති හිග්ගොල්ල කොම්පෝස්ට් අංගනයේ කොම්පෝස්ට් නිෂ්පාදන කටයුතු 2016 ජූලි සිට ආරම්භ කර තිබූ නමුත් 2018 ජූනි 15 දින සිට කොම්පෝස්ට් නිෂ්පාදන කටයුතු අත්හිටුවා තිබුණි.

(ii) මහා නගර සභාව විසින් දෛනිකව එකතු කරන දිරන කසළ ටොන් 4 ක් පමණ කොම්පෝස්ට් නිෂ්පාදනය කළ හැකි පරිදි විධිමත්ව කොම්පෝස්ට් බක්කිවල ඇසුරුම් නොකර අවිධිමත් ලෙස පාරිසරික ගැටළු මතුවිය හැකි අයුරින් අංගනය අසළ විවෘත භූමියේ ගොඩගසා තිබුණි. කොම්පෝස්ට් නිෂ්පාදන ව්‍යාපෘතිය සඳහා මධ්‍යම පරිසර අධිකාරිය මඟින් නගර සභාව වෙත ලබා දී තිබූ 2015 ජූලි 15 දිනැති අංක CEA – B – 01132(RO) දරන බලපත්‍රයේ සඳහන් 2.3, 2.4, 2.5, 2.7 සහ 2.8 යන කොන්දේසි උල්ලංඝනය වන පරිදි කටයුතු කර තිබුණි.

(iii) කසළ බැහැර කරනු ලබන වාරියපොලවත්ත පෞද්ගලික ඉඩම සම්බන්ධයෙන් ප්‍රදේශවාසීන්ගේ විරෝධතා හේතුවෙන් සභාවට හා මධ්‍යම පරිසර අධිකාරියට එරෙහිව පවරා තිබූ නඩුව සඳහා සමාලෝචිත වර්ෂය අවසාන වන විට නඩු ගාස්තු වශයෙන් රු.3,515,919 ක් දැරීමට සිදුවී තිබුණි. මෙම ගැටළුවට විසඳුමක් වශයෙන් කසළ බැහැර කිරීම සඳහා 2010 වර්ෂය තුළ රු.2,000,000 ක් වැයකර ඉඩමක් මිලදීගෙන එහි සනීපාරක්ෂක කසළ බිම් පිරවුම් මූලික ශක්‍යතා හා සැළසුම් සකස් කිරීම සඳහා රු.400,000 ක් වැයකර තිබූ නමුත් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් එකී ඉඩමට විධිමත්ව කසළ බැහැරකිරීමේ ක්‍රමවේදයක් ආරම්භ කිරීමට අපොහොසත් වී තිබුණි.

(ඊ) පාරිසරික ගැටලු

------------------

2015 වර්ෂයේ සිට පල්දෝරු පද්ධතිය අක්‍රීය බව දැනුවත්ව සිටියදීත් 2018 ජනවාරි 12 දින වන විටද සභාවේ ගලී බවුසරය යොදා ඉවත් කරන මළ අපද්‍රව්‍ය මෙම අක්‍රීය ස්ථානයට බැහැර කිරීම හේතුවෙන් පරිසරයට සිදුවන හානිය සම්බන්ධයෙන් සභාවේ අවධානය යොමු වී නොතිබුණි.

(උ) තිරසර සංවර්ධන ඉලක්ක

-------------------------------

තිරසර සංවර්ධන අරමුණු සම්බන්ධයෙන් වූ 2030 න්‍යාය පත්‍රය පිළිබඳව සභාව විධිමත් පරිදි දැනුවත්ව නොතිබීම හේතුවෙන් එම අරමුණු සඳහා වන ගෝලීය දර්ශක තුළින් සභා බලප්‍රදේශයේ මහජනතාවගේ ජීවන තත්ත්වය සහ සෞඛ්‍ය නංවාලීම සඳහා වන දිගු කාලීන සැළසුම් 2018 ජූනි 30 දින වන විටත් සකස්කර නොතිබුණි.

3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

-----------------------------------

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) 2016 වර්ෂයේ සභාවේ වාහන අංගනය ඉදිකිරීම සඳහා ලැබී තිබූ රු.915,007 ක ප්‍රතිපාදන නිරවුල් නොකර තැන්පත් ලේඛනයේ දක්වා තිබුණි.

(ආ) වර්ෂ ගණනාවක් තිස්සේ දිගින් දිගටම මූල්‍ය ප්‍රකාශනවල පැවත එන රු.181,310 ක් වූ ශේෂ 3 ක් නිරවුල් කිරීමට සභාව කටයුතු කර නොතිබුණි.

(ඇ) මාතලේ මහා නගර සභාවට අයත් තමගාවා නිවාඩු නිකේතනයේ අමුත්තන්ගේ පැමිණීමේ ලේඛනයේ 2016 ජූනි 20 දිනෙන් පසු පැමිණි අමුත්තන් පිළිබඳ කිසිදු සටහනක් ඇතුළත් කර නොතිබුණි. නිකේතනයේ කාමර සැපයීම වෙනුවෙන් භාරකරු විසින් අවස්ථා 7කදී අයකර තිබූ රු.14,661 ක ගාස්තු නගර සභාව වෙත ගෙවා නොතිබුණි. නිකේතනය කල් ඇතිව වෙන් කිරීමේ අයදුම්පත් සඳහා විධිමත් නිලධාරියෙකුගේ අනුමැතියක් ලබා ගැනීමේ ක්‍රමවේදයක් ද නොතිබුණි.

එමෙන්ම තමගාවා නිවාඩු නිකේතනයෙන් වාර්ෂිකව අයකර ගැනීමට අපේක්ෂිත ආදායම නිශ්චිතව ඇස්තමේන්තුගතකර නොතිබූ අතර, වාර්ෂිකව දරන ලද විදුලි, ජල, සේවක වැටුප් සහ අතිකාල වියදම සැළකිල්ලට ගැනීමේදී ආදායම් ඉපයීමේ අරමුණින් පවත්වාගෙන යන මෙම ස්ථානයෙන් නගර සභාවට පාඩුවක් සිදුව තිබූ බව නිරීක්ෂණය විය.

3.3 මානව සම්පත් කළමනාකරණය
-----------------------------------

සභාවේ නාගරික කොමසාරිස් තනතුර වර්ෂ 1 කට වැඩි කාලයක සිට පුරප්පාඩුව පැවැති අතර, සභාවේ අනෙකුත් අනුමත තනතුරු 27 ක පුරප්පාඩු 114 ක් පැවතුණි.

3.4 මෙහෙයුම් අකාර්යක්ෂමතා
------------------------------

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) (i) නගර සභා බලප්‍රදේශයේ කොට්ඨාශ අංක 11 හි "පයිප්ප ලේන් " කොටසෙහි වූ කුඹුරක් විධිමත් අනුමැතියකින් තොරව ගොඩකර, කොටස්කර පුද්ගලයින්ට ලබා දී තිබූ නමුත් එකී ඉඩම් කට්ටි කිරීම සම්බන්ධයෙන් 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරි පනතේ 20,21 හා 22 වගන්ති ප්‍රකාරව කටයුතුකර නොතිබුණි.

(ii) 2017 සැප්තැම්බර් 9 දින සිදුකළ ක්ෂේත්‍ර පරීක්ෂාව අනුව සභාවේ අනුමැතියකින් තොරව එහි නිවාස 80 ක් පමණ ඉදිකර තිබූ අතර, 2011 වර්ෂයේ පැවති වරිපනම් තක්සේරුවේදී මෙම අනවසර නිවාස 41 ක් සඳහා වරිපනම් අයකරමින් පැවතුණි.

(ආ) 2016 වර්ෂයේ හා 2017 සැප්තැම්බර් 30 දක්වා පිළිවෙලින් අවස්ථා 13 කදී හා 22 කදී රු.281,633 ක් හා රු.641,152 ක් අනවසර ඉදිකිරීම් නියමානුකූල කිරීමේ ගාස්තු ලෙස සභාව අයකර තිබූ අතර, පැමිණිලිවලින් හා වෙනත් මාර්ගවලින් ලද තොරතුරු මත පමණක් අනවසර ගොඩනැගිලි සම්බන්ධයෙන් කටයුතුකර තිබුණද, මේ පිළිබඳව විධිමත් ක්‍රමවේදයක් අනුගමනය කර නොතිබුණි.

(ඇ) සභාව පවත්වාගෙන යනු ලබන මාතෘ හා ළමා සායන මධ්‍යස්ථාන 5 ක ගොඩනැගිලි පහසුකම් ප්‍රමාණවත් නොවීම, සෞඛ්‍ය ආරක්ෂිත ලෙස ඖෂධ ගබඩා කිරීම සහ සෞඛ්‍ය ප්‍රකාශන රඳවා ගැනීම සඳහා පහසුකම් නොවීම, ප්‍රතිලාභීන් සඳහා ප්‍රතිකාර ලබා ගැනීම් අවස්ථාවේ ඉඳුම් හිටුම් පහසුකම් නොමැතිවීම හා ප්‍රමාණවත් සනීපාරක්ෂක පහසුකම් නොවීම වැනි අඩුපාඩු පැවති බැවින් සායන මධ්‍යස්ථානවලින් වඩාත් ඵලදායි සේවාවක් ලබාදීමට නොහැකි වී තිබුණි. මෙකී අඩුපාඩු සකස් කර ගැනීම සඳහා සෞඛ්‍ය අංශයේ ප්‍රාග්ධන වත්කම් අළුත්වැඩියා හා නඩත්තු සඳහා වෙන්කර තිබූ රු.200,000 ක ප්‍රතිපාදන හෝ යොදවා නොතිබුණි.

(ඈ) දුම්රිය දෙපාර්තමේන්තුවට අයත් වර්ග අඩි 4680 ක පමණ බිම් ප්‍රමාණයක වූ බඩු ගබඩාවේ පොදු වෙළඳපලක් ඉදිකිරීම සඳහා බදු පදනම මත පවරාදීමට දුම්රිය දෙපාර්තමේන්තුව එකඟ වී නාගරික සංවර්ධන අධිකාරියේ මූල්‍ය ප්‍රතිපාදන මත ගොඩනැගිල්ලේ නවීකරණ කටයුතු සඳහා 2016 ජූනි වන විට රු.4,295,086 ක් වැයකර තිබුණි. 2017 ඔක්තෝබර් 09 දින වන විටත්, ගොඩනැගිල්ලේ දොරවල් සවිකිරීම හා ඉහල මහලයේ කඩ වෙන්කිරීම සිදු නොකර නොනිමි අනාරක්ෂිත ගොඩනැගිල්ලක් ලෙස පැවතුණි. ගොඩනැගිල්ල භාවිතා කිරීම සම්බන්ධයෙන් 2018 ජූලි 30 වන විටත්, දුම්රිය දෙපාර්තමේන්තුව සමඟ විධිමත් බදු ගිවිසුමකට එළඹ නොතිබුණි.

3.5 වත්කම් කළමනාකරණය

----------------------------

3.5.1 නන්දිමිත්‍ර ඒකනායක ජාත්‍යන්තර හොකී ක්‍රීඩාංගනය

------------------------------------------------------

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) මධ්‍යම පළාත් සභාවේ 2002 සැප්තැම්බර් 11 දින අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී යථෝක්ත ක්‍රීඩාංගනය නගර සභාව වෙත පැවරීමට තීරණය කර ඒ බව 2002 නොවැම්බර් 11 දිනැති මධ්‍යම පළාත් ප්‍රධාන අමාත්‍යාංශ ලේකම්ගේ ලිපියක් මඟින් දැනුම් දී වර්ෂ 15 ක පමණ කාලයක් ගතවී තිබූ නමුත් ක්‍රීඩාංගනය පවරා ගැනීමට කටයුතු නොකර ක්‍රීඩාංගනයේ පාලන හා නඩත්තු කටයුතු පමණක් නගර සභාව විසින් සිදුකර තිබුණි.

(ආ) මුදල් රෙගුලාසි 128(1) (ඉ) ප්‍රකාරව රජය සතු හෝ රජය භාරයේ පවත්නා වත්කම් සුරක්ෂිතව තබා ගැනීම හා සංරක්ෂණය සඳහා ප්‍රමාණවත් තරම් විධිමත් විධිවිධාන යෙදීමට ගණන්දීමේ නිලධාරීන්ගේ වගකීම වේ. එහෙත් ක්‍රීඩා කිරීමට නුසුදුසු ලෙස අබලන්ව තිබූ වර්ෂ 15 ක් පමණ පැරණි කෘතිම තණතිල්ලේ අවශ්‍ය අළුත්වැඩියා කටයුතු සිදුකිරීමට හෝ ඒ සඳහා අදාළ බලධාරීන්ගේ අවධානය යොමු කිරීමට කටයුතු කර ජාත්‍යන්තර හොකී ක්‍රීඩාංගනය ක්‍රීඩා තරඟ සඳහා යොදා ගනිමින් ඵලදායී ලෙස පරිහරණය සඳහා අවධානය යොමුකර නොතිබුණි.

3.5.2 නිෂ්ක්‍රීය / ඌන උපයෝජිත වත්කම්

----------------------------------------

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂයේදී වෙන්දේසි කිරීමට යෝජිතව පැවති රු.2,132,676 ක් වටිනා වාහන 3ක් වෙන්දේසි කිරීමට කටයුතු කර නොතිබුණි.

3.6 අවිධිමත් ගනුදෙනු

--------------------

තම අධීක්ෂණය යටතේ කටයුතු කරන සියලුම සේවකයින් නිවාඩු ලබා ඇති සති අන්ත හා ප්‍රසිද්ධ නිවාඩු දිනවලදී අධීක්ෂණ කටයුතු සිදුකළ බවට සහ තාක්ෂණ නිලධාරීන් විසින් ඉටුකළ යුතු රාජකාරි යටතට ගැනෙන ඇස්තමේන්තු සැකසීම හා මිනුම් ගැනීමේ කටයුතු ඉටුකළ බවට සාවද්‍ය ලෙස දක්වමින් සභාවේ වැඩ පරිපාලක මහතෙකු වෙත සමාලෝචිත වර්ෂයේදී රු.91,065 ක අතිකාල දීමනා ගෙවා තිබුණි.

3.7 දෘශ්‍ය අක්‍රමිකතා

------------------

ගොංගාවෙල දුම්රිය බඩු ගබඩා වෙළඳ සංකීර්ණය සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු සඳහා සභාවෙන් ලබාදෙන ලද යන්ත්‍ර හා උපකරණ අතරින් ගබඩාවට නැවත භාරනොදුන් උපකරණ 18 ක් හා අස්ථානගතවී තිබූ රු.71,925 ක් වටිනා යන්ත්‍රෝපකරණ 2 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 103,104, 104(4) සහ 105 ප්‍රකාරව කටයුතුකර නොතිබුණි.

3.8 ප්‍රසම්පාදනය

--------------

3.8.1 ප්‍රසම්පාදන සැලැස්ම

----------------------

රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.1 අනුව ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මක්, සිවිල් වැඩ, භාණ්ඩ හා වෙනත් සේවා ඇතුළත් සවිස්තරාත්මක ප්‍රසම්පාදන සැලැස්මක්, සහ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.3 අනුව ප්‍රසම්පාදන කාල සටහනක් පිළියෙලකර නොතිබුණි.

3.8.2 සැපයීම් හා සේවා
--------------------
පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) නව අභ්‍යන්තර දුරකථන පද්ධතියක් ස්ථාපිත කිරීම සම්බන්ධයෙන් පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(i) සභාවේ ස්ථාපිත කර තිබූ අභ්‍යන්තර දුරකථන පද්ධතියේ පැවති දෝෂ හා ඇතැම් කොටස් අක්‍රිය වීම හේතුවෙන් නව පද්ධතියක් ස්ථාපිත කිරීම සඳහා නාගරික කොමසාරිස්ගේ ඉල්ලීම අනුව ටෙලිකොම් ආයතනයෙන් රු.789,498 ක ඇස්තමේන්තුවක් ඉදිරිපත්කර තිබූ අතර, 2016 අප්‍රේල් 5 දිනැති අංක 8.1.3 දරන සභා තීරණය පරිදි දුරකථන සේවා සපයන වෙනත් ආයතන 4කින් නිසි පිරිවිතර සකස් කිරීමකින් තොරව මිල ගණන් කැඳවා තිබුණි.

(ii) ඉදිරිපත්ව තිබූ එක් ආයතනයක මිල ගණන මත පදනම්ව නැවත මිල කැඳවීමක්ද නොකර ටෙලිකොම් ආයතනයේ මිල ගණන් සහ ලබාදෙන සේවාවේ ගුණාත්මකභාවය සමඟද සැසඳීම් නොකර තෝරාගත් පෞද්ගලික ආයතනයෙන් රු.338,000 කට අභ්‍යන්තර දුරකථන පද්ධතිය ස්ථාපිත කරගෙන තිබුණි.

(iii) ටෙලිකොම් ආයතනයෙන් ස්ථාපනය කර තිබූ පැරණි අභ්‍යන්තර දුරකථන සම්බන්ධතාවයේ සේවා කිරීම් වෙනුවෙන් මාසිකව ගෙවන රු. 1,169 ක මුදල සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් ගෙවීම හේතුවෙන් ලබා නොගන්නා සේවාවක් වෙනුවෙන් 2017 වර්ෂයේ ජූලි සිට 2018 අප්‍රේල් දක්වා රු.8,183ක් වැඩිපුර ගෙවා තිබුණි.

(ආ) සුපිරි වෙළඳ සංකීර්ණයේ දෙවන හා තෙවන මහල් බදු දීම සම්බන්ධයෙන් පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(i) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.6 ප්‍රකාරව ලංසු කැඳවීමේ දී ලංසුකරුවන්ට සාධාරණ පදනමක් මත තරඟකාරී ලෙස මිල ගණන් ඉදිරිපත්කළ හැකි අයුරින් අවශ්‍ය සියලුම විස්තර සහ පිරිවිතරයන් සහිත නිශ්චිත තොරතුරු සඳහන් නොකර 2013 පෙබරවාරි 22 දිනැතිව භාෂාත්‍රයෙන්ම පුවත්පත් දැන්වීමක් පළකර තිබුණි. එබැවින් ගැණුම්කරුවන් කිසිවෙක් මිල ගණන් ඉදිරිපත්කර නොතිබූ අතර, දැන්වීම සඳහා වැයකර තිබූ රු.153,530 ක මුදල නිශ්කාර්ය වියදමක් වී තිබුණි.

(ii) ගොඩනැගිල්ලේ පවතින තත්ත්වය පිළිබඳ පැහැදිළි පදනමක් යටතේ කඩ කාමර 20 ක් සඳහා තක්සේරු දෙපාර්තමේන්තුවෙන් ඉදිරිපත් කර තිබූ අවම මාසික කුළිය පදනම්කර නොගෙන 2014 දෙසැම්බර් 02 දිනැති විශේෂ මහා සභා තීරණය පරිදි කඩ කාමර වෙන් කිරීමේ කිසිදු මූලික පදනමකින් හා සැලැස්මකින් තොරව, මහල් දෙකේ මුළු වර්ග අඩි ප්‍රමාණය පදනම් කරගනිමින් 2014 දෙසැම්බර් 22 හා 2015 පෙබරවාරි 9 දිනැතිව නැවතත් ලංසු කැඳවා තිබුණි.

(iii) 2015 මැයි වන විට දෝෂ සහිත ඇගයුම් නිර්ණායක සහ අපැහැදිළි පිරිවිතරයන් භාවිතයෙන් ලංසු සැසඳීම කර ගැණුම්කරුවන් 37 දෙනෙකු තෝරා ගැනීම හේතුවෙන් 2018 ජූනි වන විටත් මහල් දෙකේ කඩ කාමර වෙන්කර බදු දීමට නොහැකි වී තිබුණි.

(iv) තක්සේරුගත කුළිය පදනම් කරගනිමින් ඉදිරි කටයුතු නොකිරීම මත 2016 වර්ෂයේ සිට 2017 දෙසැම්බර් දක්වා සභාවට ලබාගතහැකිව තිබූ රු.5,850,000 ක කුලී ආදායමක් අහිමි වී තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය තුළ සිදුකර තිබූ මිලදී ගැනීම් සම්බන්ධයෙන් පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(i) 1989 ජනවාරි 20 දිනැති අංක 541/17 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයෙන් ප්‍රකාශිත සම්මත අතුරු ව්‍යවස්ථාව v කොටසේ 4 වගන්තිය ප්‍රකාරව සියළු කොන්දේසි ඇතුළත් ටෙන්ඩර් කැඳවීම් ආකෘති පත්‍ර නොමැතිව අවස්ථා 05 කදී රු. 205,050 ක මිලදී ගැනීම් සිදුකර තිබුණි.

(ii) සම්මත අතුරු ව්‍යවස්ථාව v කොටසේ 7 (අ) වගන්තිය ප්‍රකාරව ලැබුණු එක් එක් ටෙන්ඩර් ලිපි කවරවල දින මුද්‍රාව යොදා නොතිබූ අවස්ථා සහ ලිපිකවර නොමැතිව මිල ගණන් ඉදිරිපත් කළ අවස්ථා පැවතුණි. එමෙන්ම ලැබුණු ටෙන්ඩර් පිළිබඳව ලේඛනයක් පවත්වා නොතිබූ බැවින් ටෙන්ඩර් විවෘත කිරීමේදී අතුරු ව්‍යවස්ථාවේ v කොටසේ 8(අ) සහ (ඇ) වගන්ති ප්‍රකාරව ද කටයුතු කර නොතිබුණි.

(iii) 2017 වර්ෂයේ කර්මාන්ත අංශයේ කටයුතු සඳහා අවශ්‍ය ගොඩනැගිලි ද්‍රව්‍ය මිලදී ගැනීම සඳහා ලියාපදිංචි වී තිබූ ආයතන හතරකින් මුද්‍රා නොතැබූ මිල ගණන් ඉදිරිපත්කර තිබූ ආයතන තුනක් සම්බන්ධයෙන් 2017 ඔක්තෝබර් 31 දිනැතිව සිදුකළ ස්ථානීය පරීක්ෂාවේදී මෙම ස්ථාන තුන වෙනුවට එක් ව්‍යාපාරික ස්ථානයක් පමණක් පවතින බව හා එක් ආයතනයක ලිපිනයෙහි සිල්ලර වෙළඳසැළක් පවතින බව නිරීක්ෂණය විය. එබැවින් ව්‍යාජ මිල ගණන් පදනම් කර ගනිමින් එක් ආයතනයකින් 2017 ජනවාරි සිට ජූලි දක්වා කාලය තුළදී රු.178,725 ක ද්‍රව්‍ය විනිවිදභාවයකින් තොරව මිලදීගෙන තිබුණි.

3.8.3 කොන්ත්‍රාත් පරිපාලනය
-----------------------------
පෙරමුසු යොදා මාර්ග නඩත්තුව
--------------------------------------
පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) විධිමත් ක්ෂේත්‍ර පරීක්ෂාවක් මඟින් පෙරමුසු යොදා නඩත්තු කළයුතු මාර්ග හඳුනා නොගැනීම නිසා 2016 වර්ෂය තුළ නඩත්තු කළයුතු ලෙස ඇස්තමේන්තු කර තිබූ රු.1,009,666 ක වටිනාකමින් යුතු මාර්ග 9 ක නඩත්තු අවශ්‍යතාවයන් ඇති නොවී වෙන්කළ ප්‍රතිපාදන මුදල් ඉතිරි වී තිබුණි.

(ආ) නිවැරදි ඇස්තමේන්තු සැකසීමේ ක්‍රමවේදයක් අනුගමනය කර නොතිබීම හේතුවෙන් 2017 වර්ෂය තුළ අළුත්වැඩියාවන් සිදුකළ මාර්ග 6 ක ඇස්තමේන්තුගත ද්‍රව්‍ය ප්‍රමාණ අතර විශාල වශයෙන් විචලනයක් පැවති අතර, 2017 වර්ෂය තුළ අළුත්වැඩියාවන් සිදුකළ මාර්ග 6 ක ඇස්තමේන්තුගත හා භාවිතාකර ඇති ද්‍රව්‍ය ප්‍රමාණ අතර සියයට 55 සිට 79 දක්වා විචලනයන් පැවතුණි.

(ඇ) 2016, 2017 වර්ෂවල මාර්ග නඩත්තු කටයුතුවලදී රෝල භාවිතය අවශ්‍ය වන ස්ථානවලද තාප්ප මෝල මඟින් තැලීම් සිදුකර තිබූ බැවින් පෙරමුසු පිරවීම් මාර්ගතලයට වඩා ගිලා බැසීම නිසා වලවල් නිර්මාණය වීම, පෙරමුසු යොදන ලද ස්ථානවලින් පෙරමුසු කෙටිකලකින්

ගැලවී ඉවත් වී තිබීම වැනි අවස්ථා පැවතුණි. 2017 ජූලි 13 දිනැතිව සිදුකළ ස්ථානීය පරීක්ෂාවේදී ඇස්තමේන්තු වටිනාකම රු.313,153 ක් වූ පාරවල් තුනක එවැනි අඩුපාඩු පැවතුණි.

4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය
-----------------------------------------

4.1 අයවැය පාලනය
-----------------

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) ආදායම් විෂයන් 6 ක ඇස්තමේන්තුගත ආදායම හා තථ්‍ය ආදායම අතර විචලනය සියයට 20 සිට සියයට 106 අතර පරාසයක පැවතුණි.

(ආ) වැය විෂයන් 20 ක් සඳහා සලසා දී තිබුණු රු.5,573,630 ක ප්‍රතිපාදන වලින් කිසිදු වියදමක් නොදරා ඉතිරි කර තිබුණි.

(ඇ) වැය විෂයයන් 44 කට අදාළව සමාලෝචිත වර්ෂයේ ශුද්ධ ප්‍රතිපාදනය සහ තථ්‍ය වියදම අතර විචලනය සියයට 50 ක සිට සියයට 99 දක්වා පරාසයක පැවතුණි.

(ඈ) වැය ශීර්ෂ 10 ක ප්‍රතිපාදන සීමාවන් ඉක්මවා රු.206,624 ක් වූ වියදම් දරා තිබුණි.

4.2 අභ්‍යන්තර විගණනය
------------------------

මහා නගර සභාවේ අභ්‍යන්තර විගණන අංශය සඳහා එක් නිලධාරියෙකු පමණක් අනුයුක්තව සිටි අතර, ප්‍රමාණවත් කාර්ය මණ්ඩලයක් නොමැතිවීම හේතුවෙන් අභ්‍යන්තර විගණන සැලැස්ම පරිදි විගණන කටයුතු සිදුකර නොතිබුණි.

4.3 විගණන හා කළමනාකරණ කමිටු
-------------------------------------

2014 අගෝස්තු 08 දිනැති පළාත් පාලන කොමසාරිස්ගේ අංක සිපීසී/සීඑල්ජී/1/9/1/4 දරන ලිපිය හා 2014 අගෝස්තු 01 දිනැති මධ්‍යම පළාත් ප්‍රධාන ලේකම්ගේ අංක සීපීසී/සීඑම්සී/1/6 දරන ලිපිය ප්‍රකාරව කාර්තුවකට 1 බැගින් අවස්ථා හතරකදී විගණන හා කළමනාකරණ කමිටු පැවත්විය යුතු වුවද, සමාලෝචිත වර්ෂය තුළ එක් අවස්ථාවකදී පමණක් කමිටුව පවත්වා තිබුණි.

5. පද්ධති හා පාලන
-------------------

විගණනයේදී නිරීක්ෂණය වූ අඩුපාඩු වරින්වර සභාවේ අවධානයට යොමුකර ඇති අතර, පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමුකළ යුතුය.

| | පද්ධතිය | | අඩුපාඩුව |
|---|---|---|---|
| (අ) | සේවක කළමනාකරණය | | කාර්ය මණ්ඩල පුරප්පාඩු පැවතීම |
| (ආ) | වත්කම් | (i) | වත්කම් නිශ්ක්‍රියව පැවතීම |
| | | (ii) | සමීක්ෂණ නොපැවැත්වීම. |
| | | (iii) | ආරක්ෂාව තහවුරු නොකිරීම. |
| | | (iv) | වත්කම් පවරා ගැනීමට හා අයිතිය නිරවුල් කර ගැනීමට කටයුතු නොකිරීම. |
| (ඇ) | අයවැය පාලනය | (i) | ප්‍රතිපාදන උපයෝජනය කර නොතිබීම. |
| | | (ii) | ආදායම් ඉලක්ක සපුරා නොගැනීම. |